## සත්ව පොහොර භාවිතයේ වාසි

- වැඩිපුර පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණයක් ලබාදීම
- බොහෝ සත්ව පොහොරවල දක්නට ලැබෙන හොඳින් දිරාපත් වීමේ හැකියාව
- බොහෝවිට අපද්‍රව්‍ය ලෙස විවිධ ප්‍රදේශවල පහසුවෙන් සපයා ගැනීමේ හැකියාව
- නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට්හි බර වැඩි කිරීමට දායක වීම
- බොහෝ සත්ව පොහොර භාවිතා කිරීමෙන් නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට්හි හොඳ පැහැයක් ලැබීම
- කොම්පෝස්ට් නිෂ්පාදනයට අවශ්‍ය ක්ෂුද්‍ර ජීවීන් එක් වීම
- අමුද්‍රව්‍ය ලෙස භාවිතා කිරීමේ පහසුව

## ගොම

කොම්පෝස්ට් නිෂ්පාදනයට විවිධ ප්‍රදේශවල වැඩි වශයෙන් භාවිතා කරන සත්ව පොහොරය වේ. ගොම වල අන්තර්ගත වල් ඇට විනාශ වීමද කොම්පෝස්ට් නිෂ්පාදනයේදී සිදු වේ. ගොම සමඟ හැකි සෑම අවස්ථාවකදීම ගව මුත්‍රාද භාවිතා කළහැකි නම්, දිරාපත් වීම තවදුරටත් ඉක්මන්කළ හැකි අතර නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට්වලට සැලකිය යුතු ප්‍රමාණයක් නයිට්‍රජන් ලබා දීමේ හැකියාවද ඇත.

## ගොම භාවිතා කිරීමේ වැදගත්කම

- වැඩි පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණයක් ලබාදීම
- ඉක්මණින් දිරාපත් වීමේ හැකියාව
- කොම්පෝස්ට් නිෂ්පාදනයට අවශ්‍ය ක්ෂුද්‍ර ජීවීන් එක්වීම
- නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් සඳහා හොඳ පැහැයකින් ලැබීම
- වැඩි බර ප්‍රමාණයක් ලබාගැනීමට හැකි වීම

## කුකුල් පෙහොර

මේ සඳහා වඩාත් වැදගත් ලේයර් කුකුල් පොහොර වේ. බ්‍රොයිලර් කුකුල් පොහොරවල අන්තර්ගත දහයියා හෝ ලී කුඩු දිරාපත් වීමට අපහසුය. නමුත් බ්‍රොයිලර් අතුරණුව කොම්පෝස්ට් නිෂ්පාදනයට භාවිතා කරන අවස්ථාවලදී ඒ සඳහා විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් බ්‍රොයිලර් අතුරණුවද දිරාපත් කරගත හැකිවේ. ලේයර් කුකුල් පොහොර හොඳින් දිරාපත් වී ඇති නිසා කොම්පෝස්ට් නිෂ්පාදනයට පහසුවෙන් භාවිතා කළහැකිය.

## කුකුල් පොහොර භාවිතා කිරීමේ වැදගත්කම

- වැඩි පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණයක් ලබාදීම
- කොම්පෝස්ට්වලට හොඳින් පොස්පරස් ලබාදීමට හැකිවීම
- සැලකිය යුතු ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණයක් එක් වීම
- දිවයිනේ බොහෝ ප්‍රදේශවල පහසුවෙන් සපයා ගැනීමේ හැකියාව

## එළු පොහොර

එළු පොහොර සපයාගත හැකි ප්‍රදේශවල කොම්පෝස්ට් නිෂ්පාදනයට මෙම සත්ව පොහාර වර්ගයද සාර්ථකව භාවිතා කළහැකිය. විශේෂයෙන් බෙටි ආකාරයට දක්නට ලැබෙන එළු පොහොර කොම්පෝස්ට් නිෂ්පාදනයේදී හොඳින් කුඩු වී විනාශ වීම සිදු වේ.

## එළු පොහොර භාවිතා කිරීමේ වැදගත්කම

- වැඩි පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණයක් ලබාදීම
- සැලකිය යුතු ක්ෂුද්‍ර ජීවීන් ප්‍රමාණයක් එක් වීම
- නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් සඳහා හොඳ පැහැයක් ලබාදීම

කොම්පෝස්ට් නිෂ්පාදනයට ඒ ඒ ප්‍රදේශවල සුලභව දක්නට ලැබෙන ඕනෑම සත්ව පොහොරක් භාවිතා කළහැකිය. මේ සඳහා ඉහත සඳහන්කළ සත්ව පොහොරවලට අමතරව ඌරු පොහොර, වවුල් පොහොර හා වෙනත් ඕනෑම සත්ව පොහොරක් භාවිතා කළහැකිය. ප්‍රදේශයේ සුලභතාව මත ඒවා තෝරා ගැනීම වඩාත් වැදගත්ය.

## විවිධ සත්ව පොහොරවල අන්තර්ගත ප්‍රධාන ශාක පෝෂක ප්‍රමණයක්

| සත්ව පොහොර | වියළි බර අනුව % | | |
|---|---|---|---|
| | නයිට්‍රජන් | පොස්පරස් | පොටෑසියම් |
| ගොම | 1.7 | 0.7 | 0.8 |
| ලේයර් කුකුල් පොහොර | 2.3 | 1.2 | 2.2 |
| බ්‍රොයිලර් කුකුල් පොහොර | 2.2 | 0.8 | 1.9 |
| එළු පොහොර | 2.2 | 0.7 | 1.2 |
| ඌරු පොහොර | 1.5 | 0.8 | 0.7 |

2008


සැකසුම:
ආචාර්ය ජේ.ඩී. හේමන්ත විජේවර්ධන,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,
මාකඳුර, ගෝනවිල (වයඹ)

දුරකථන අංක 031-2299625
031-2299805

ෆැක්ස් 031-2299707

ඊ මේල් Wijehema@yahoo.com



කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන අනුග්‍රහයෙනි.

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Gannoruwa.


"අපි වවමු - රට නඟමු"

කොම්පෝස්ට් නිෂ්පාදනය - 2

# කොම්පෝස්ට් නිෂ්පාදනයට භාවිතා කළහැකි අමුද්‍රව්‍ය




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

කොම්පෝස්ට් නිෂ්පාදනයේදී අමු ද්‍රව්‍ය ලෙස ශාක කොටස් හා සත්ව අපද්‍රව්‍ය භාවිතා කරනු ලැබේ. විවිධ ශාක කොටස් කොම්පෝස්ට් නිෂ්පාදනයට භාවිතා කළහැකි වුවත්, ශාක පත්‍ර කොම්පෝස්ට් නිෂ්පාදනයට වඩාත් යෝග්‍ය වේ. එයට හේතුව, කොළ වර්ග ඉතා ඉක්මණින් දිරාපත් වීමේ හැකියාවයි. කොළවල සැළකිය යුතු ප්‍රමාණයක් නයිට්‍රජන් අන්තර්ගත වීම නිසා පහසුවෙන් දිරාපත් වීම සිදුවේ. ශාක පත්‍ර ළපටි හා කොළ පාට අවස්ථාවේදී පහසුවෙන් දිරාපත් කරගැනීමේ හැකියාවක් ඇත. එසේම සමහර සත්ව පොහොර පහසුවෙන් දිරාපත් වන අතර බ්‍රොයිලර් කුකුළු අපද්‍රව්‍ය එහි අන්තර්ගත දහයියා අතුරනුව නිසා දිරාපත් වීමට අපහසු වේ. කෙසේ නමුත් කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය ක්‍රමවත්ව සිදු කිරීමෙන් දිරාපත් වීමට අපහසු අමුද්‍රව්‍ය පවා දිරාපත් කරගැනීමේ හැකියාවක් ඇත.

## කොළ පොහොර

- කොළ පොහොර පහසුවෙන් දිරාපත් වීමේ හැකියාවක් ඇත
- පත්‍ර හා ළපටි දඬු කොම්පෝස්ට් නිෂ්පාදනයට වඩාත් යෝග්‍ය වේ
- වැඩි කොළදාවක් ඇති ශාක වර්ග කොම්පෝස්ට් නිෂ්පාදනයට වඩාත් සුදුසුය
- විශේෂයෙන් රනිල කුලයේ ශාක වර්ග කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදාගැනීම වැදගත්ය
- කොළ පොහොර මඟින් කොම්පෝස්ට්වලට සැළකිය යුතු නයිට්‍රජන් ප්‍රමාණයක් ලබාදෙනු ඇත

## කොළ වර්ග

මේ සඳහා පහත සඳහන් කොළ වර්ග වඩාත් සාර්ථකව භාවිතා කළහැකිය.

- ග්ලිරිසීඩියා
- ඉපිල් ඉපිල්
- වල් සූරියකාන්ත
- සන් හෙම්ප්
- ගංසූරිය
- කැකුණ
- එරබදු යනාදිය

කෙසේ නමුත්, මේ සඳහා ප්‍රදේශයේ සුලභ ඕනෑම කොළ වර්ගයක් භාවිතා කිරීමේ හැකියාව ඇත.

## කොළ වර්ග භාවිතා කිරීමේ වැදගත්කම

- ඉක්මණින් දිරාපත් වීමේ හැකියාව
- කොම්පෝස්ට්හි වැඩි නයිට්‍රජන් ප්‍රමාණයක් අන්තර්ගත වීම
- නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට්හි හොඳ පැහැයක් ලබාගත හැකිවීම

## බෝග අවශේෂ

විවිධ බෝග අවශේෂ වුවද සුලභතාවය මත කොම්පෝස්ට් නිපදවා ගැනීමේදී අමුද්‍රව්‍ය ලෙස භාවිතා කළහැකිය. විශේෂයෙන් විවිධ බෝග අවශේෂ කාබනික පොහොර ලෙස භාවිතා කිරීමේදී කොම්පෝස්ට් නිෂ්පාදනය කර භාවිතා කිරීම වැදගත්ය. එයට හේතුව, බෝග අවශේෂවල දක්නට ලැබෙන විවිධ රෝගකාරක පවා විනාශ වීම කොම්පෝස්ට් නිෂ්පාදනයේදී සිදු වීමයි. බෝග අවශේෂ ලෙස පහත සඳහන් දෑ භාවිතා කළහැකිය.

- පිදුරු
- එළවළු බෝග අවශේෂ
- වෙළඳපොල එළවළු අපද්‍රව්‍ය
- වෙනත් බෝග අවශේෂ

මෙම බෝග අවශේෂ දිරාපත් නොකර එක එල්ලේ වගාවට යෙදීමේදී විවිධ ගැටළු ඇති වන අතර, දිරාපත් වීමට සැලකිය යුතු කාලයක් ගත වේ. මෙවැනි බෝග අවශේෂ බෝග වගාවට සාර්ථකව භාවිතා කළහැකි ක්‍රමය නම්, ඒවා උපයෝගී කර ගැනීමෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කර භාවිතා කිරීමයි.

## පිදුරු භාවිතා කිරීමේ වැදගත්කම

- පහසුවෙන් සපයා ගැනීමේ හැකියාව
- පොටෑසියම් පෝෂ්‍ය පදාර්ථය සැළකිය යුතු ප්‍රමාණයක් අන්තර්ගත වීම
- කොම්පෝස්ට් නිෂ්පාදනයේදී භාවිතා කිරීමේ පහසුව
- ඒකාකාරී සංයුතියකින් යුක්ත වීම

## ජලජ වල් පැළෑටි

විවිධ ජලජ වල් පැළෑටි පවා කොම්පෝස්ට් නිෂ්පාදනයේදී අමුද්‍රව්‍ය ලෙස භාවිතා කළහැකිය. මෙම අමුද්‍රව්‍ය භාවිතා කිරීමේදී වැව් හා ජලාශ ආශ්‍රිතව කොම්පෝස්ට් නිපදවා ගැනීමට යොදාගැනීම වඩාත් වැදගත්ය. මක් නිසාද යත්, සමහර ජලජ වල් පැළෑටි ප්‍රවාහනය කිරීම තහනම්කර ඇති බැවිනි. මේ සඳහා සැල්විනියා, ජපන් ජබර වැනි දෑ කොම්පෝස්ට් නිෂ්පාදනයේදී පහසුවෙන් දිරාපත් කරගත හැකි බව පෙනී ගොස් ඇත.

## ජලජ වල් පැළෑටි භාවිතා කිරීමේ වැදගත්කම

- ඉක්මණින් දිරාපත් වීම
- හොඳ පැහැයකින් හා තත්ත්වයෙන් උසස් කොම්පෝස්ට් ලබාගැනීමේ හැකියාව
- ජලාශවලට සිදුවන හානිය අවම කරගැනීම
- විනාශකාරී ජලජ වල් පැළෑටි වඳ කිරීමේ හැකියාව
- දිවයිනේ විවිධ ප්‍රදේශවල පහසුවෙන් සපයා ගැනීමේ හැකියාව
- කුඩා ප්‍රදේශයකින් වැඩි අමුද්‍රව්‍ය ප්‍රමාණයක් සපයා ගැනීමේ හැකියාව
- කොම්පෝස්ට් නිෂ්පාදනයෙන් සම්පූර්ණයෙන් බීජ හා දඬු මැරී යාම නිසා පැතිරීමක් සිදු නොවීම

## තණකොළ

ගොඩබිම්හි දක්නට ලැබෙන විවිධ තණකොළ වර්ග කොම්පෝස්ට් නිෂ්පාදනයේදී අමුද්‍රව්‍ය ලෙස භාවිතා කළහැකිය. බොහෝවිට තණකොළ පහසුවෙන් දිරාපත් කරගැනීමේ හැකියාවක් ඇත. මෙසේ වල් පැළෑටි කොම්පෝස්ට් නිපදවා ගැනීමට යොදා ගැනීමෙන් වල්නාශක යෙදීම නිසා සිදුවන පරිසර දූෂණය අවම කරගැනීමටත්, එසේම වල්නාශක සඳහා වියදම් වන මුදල් අවම කරගැනීමටත් අවස්ථාවක් උදා වේ. මේ සඳහා ගිනි තණ වැනි රළු ස්වභාවයක් ඇති තණකොළ වර්ගවලින් පවා සාර්ථකව කොම්පෝස්ට් නිෂ්පාදනය කරගත හැකි බව පෙනී ගොස් ඇත. ගිනි තණ සීඝ්‍රයෙන් වර්ධනය වන නිසා මෙන්ම ලංකාවේ බොහෝ ප්‍රදේශවල දක්නට ලැබෙන නිසා එය කොම්පෝස්ට් නිෂ්පාදනයට භාවිතා කිරීම වැදගත්ය.

## තණකොළ භාවිතා කිරීමේ වැදගත්කම

- පහසුවෙන් දිරාපත් වීම
- සැලකිය යුතු පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණයක් අන්තර්ගත වීම
- පහසුවෙන් හා ලාභදායීව සපයා ගැනීමේ හැකියාව
- පරිසරය පවිත්‍රව තබාගැනීමේ හැකියාව
- කොම්පෝස්ට් නිෂ්පාදනයෙන් සම්පූර්ණයෙන් බීජ හා දඬු මැරී යාම නිසා පැතිරීමක් සිදු නොවීම

## තෝරාගත් කොළ පොහොර හා පිදුරු වල අන්තර්ගත ප්‍රධාන ශාක පෝෂක ප්‍රමාණයන්

| ශාක වර්ගය | වියළි බරඅනුව % | | |
| --- | --- | --- | --- |
| | නයිට්‍රජන් | පොස්පරස් | පොටෑසියම් |
| ග්ලිරිසීඩියා | 4.2 | 0.3 | 2.1 |
| එරබදු | 4.0 | 0.3 | 2.4 |
| වල් සූරියකාන්ත | 4.7 | 0.4 | 3.2 |
| ගංසූරිය | 3.4 | 0.3 | 2.2 |
| සන් හෙම් | 2.9 | 0.3 | 0.7 |
| ඉපිල් ඉපිල් | 1.5 | 0.2 | 1.2 |
| පිදුරු | 0.6 | 0.2 | 2.2 |

## සත්ව පොහොර

කොම්පෝස්ට් නිෂ්පාදනයේදී ශාක කොටස්වලට අමතරව සත්ව අපද්‍රව්‍ය භාවිතා කිරීමද වැදගත්ය. මෙහිදී සත්ව මල හා මූත්‍රා භාවිතා කරනු ලැබේ. කොම්පෝස්ට් නිෂ්පාදනයේ සාර්ථකත්වයට සත්ව පොහොරවල දායකත්වය ඉමහත්ය.

මේ නිසා කොම්පෝස්ට් නිෂ්පාදනයේදී ශාක කොටස්වලට අමතරව හැකි සෑම අවස්ථාවකම සත්ව පොහොර භාවිතා කිරීම වැදගත්ය. එමඟින් තත්වයෙන් උසස් කොම්පෝස්ට් නිෂ්පාදනය කරගැනීමට හැකි වේ.